# ශ්‍රී ලංකාව දෙමළ දරුවන් පාසල් හැරයාමට බලපාන සමාජ හා ආර්ථික සාධක (පැල්මඩුල්ල ප්‍රාදේශීය කොට්ඨාසයේ වතු දෙමළ ජනතාව ඇසුරින්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ටී. එම්. කේ නිල්මිණි [1]**
**සීතා පි. බී බණ්ඩාර [2]**

**සංක්ෂේපය**

අධ්‍යාපනය මිනිසාගේ කායික, මානසික, සමාජීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික යනාදි සහජ ශක්තීන් වර්ධනය කරන්නාවූ නිත්‍ය ක්‍රියාවලියකි. 1948 එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගින් අධ්‍යාපනය සියලුම දෙනා සතු අයිතිවාසිකමක් ලෙස පිළිගැනීමත් සමග ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කරන ලදි. ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය සර්ව සාධාරණ ලෙස බෙදීයාමේ විෂමතා පවතින අතර වතු ආශ්‍රිතව ජීවත් වන දෙමළ දරුවන් විෂමතාවල ගොදුරක් බවට පත්ව තිබේ. මේ නිසා අවුරුදු 5 ත් 14 ත් අතර දරුවන් අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කර තිබියදීත් දෙමළ දරුවන් පාසල් හැරයයි. දෙමළ දරුවන් පාසල් හැරයාමට බලපාන සමාජ හා ආර්ථික සාධක විමසා බැලීම මෙම අධ්‍යනයේ මූලික අරමුණ වෙයි.

අධ්‍යයන ප්‍රදේශය වන්නේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. අධ්‍යයනය සඳහා දත්ත ලබා ගන්නේ පොරෝණුව, බැරණ්ඩුව, රිල්හේන හා ගොඩගම වසම් තුළින් අහඹු ලෙස තොරා ගන්නා ලද 50 දෙනෙකුගේ නියදියකිනි. වයස් කාණ්ඩය මෙහිදි සැලකිල්ලට ගනු ලබන අතර අවුරුදු 5 -16 අතර 1 ශ්‍රේණියේ සිට අ.පො.ස සා.පෙළ දක්වා වයස් කාණ්ඩයේ දරුවන් සැලකිල්ලට ගනු ලබයි. ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරනු ලැබීය. දත්ත විශ්ලේෂණය විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය මගින් සිදු කරන ලදි.

එහිදි පාසල් අතහැරගොස් ඇති දරුවන්ගේ ස්ත්‍රී පුරුෂ නියෝජනය අනුව පිරිමි දරුවන්ගෙන් 70% ක් හා ගැහැණු දරුවන්ගෙන් 30%ක් ද අඩු ආදායම් ලබන පවුල්වල දරුවන් 78%ක් ද අධ්‍යාපන කටයුතු සඳහා අඩු මුදලක් වෙන්කරන ලද පවුල්වල දරුවන් 58% ක් ද, කම්කරුවන්ගේ දරුවන් 83%ක් ද, දරුවන්ට අකුරු හැකියාව නොමැතිකම නිසා 38% ක් ද, දෙමාපියන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි අවධානය යොමු නොකිරීම හා දෙමාපියන් නූගත් අය වීම නිසා 54%ක් ද, පාසල් දුරින් පිහිටා තිබෙන දරුවන් 80% ක් ද, පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩි නිසා 50% ක ද ගෙදර අඩුපාඩු නිසා 42% ක් ද පාසල් හැර යයි. මේ අනුව දෙමළ දරුවන් පාසල් හැරයාමට සමාජ හා ආර්ථික සාධක බලපාන බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද : සමාජ හා ආර්ථික සාධක, දෙමළ දරුවන්, අධ්‍යාපනය, පාසැල් හැරයාම, ශ්‍රී ලංකාව**

*1. ආර්ථික විද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*